# ශාස්ත්‍ර පීඨය
# කොළඹ විශ්වවිද්‍යාලය

## කථන දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව
## (කෙටිකාලීන පාඨමාලාව) - කණ්ඩායම 08 ( TSC 08 )

**කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් යථෝක්ත කෙටිකාලීන පාඨමාලාව සඳහා 2017 අප්‍රේල් මස 7 වෙනි දින දක්වා අයදුම් පත් භාරගනු ලැබේ.**

- **කා සඳහාද :**
  **ඉතා චතුර ලෙස දෙමළ බසින් කථා කිරීමට සහ සවන්දීම, කථා කිරීම, කියවීම සහ ලිවීම යන දෙමළ භාෂා කුසලතා වර්ධනය කර ගැනීමට අභිලාෂයක් දක්වන්නාවූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්, දෙමළ බස උගන්වන පාසල් ගුරු භවතුන් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍ය - ශිෂ්‍යාවන් සඳහා වර්තමාන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ IV සහ III මට්ටමට අදාළ විෂය නිර්දේශයට අනුකූල ව ඉගැන්වේ. (කිසිදු දෙමළ භාෂා දැනුමක් අවශ්‍ය නො වේ.)**

- **පාඨමාලා කාලය :**

  මාස 4 යි පැය 60 යි, (ඉරිදා දිනවල) උදේ 09.00 පස්වරු 1.00
  දිනකට පැය 04 යි. ( සහභාගි වන්නන් සීමිත සංඛ්‍යාවක් ලියාපදිංචි කෙරේ.)

- **ගාස්තුව :**

| | | |
|---|---|---|
| පාඨමාලා ගාස්තුව | : | රු.15,000/- (අධ්‍යයන උපකාරක සහිතව) |
| අයදුම්පත්‍ර ගාස්තුව | : | රු. 500/- |
| ලියාපදිංචි ගාස්තුව | : | රු. 1000/- |
| **මුළු පාඨමාලා ගාස්තුව** | : | රු. 16,500/- (ලියාපදිංචි අවස්ථාවේ දී ගෙවිය යුතු ය) |

- **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2017 අප්‍රේල් මස 7**
- **උපදේශන මාධ්‍යය** : සිංහල
- **අයදුම්පත්**

  අයදුම්පත්‍ර, අත්පොත සහ අනෙකුත් විස්තර නියෝජ්‍ය ලේඛකාධිකාරි, පීඨාධිපති කාර්යාලය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, රීඩ් මාවත, කොළඹ 07 වෙත පෞද්ගලික ව පැමිණ හෝ **arts.cmb.ac.lk** වෙබ් අඩවියෙන් හෝ ලබා ගත හැකි ය. නිවැරදි ව සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත **2017 අප්‍රේල් මස 7** වෙනි දින හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට තැපැල් මගින් එවීමට හෝ එම කාර්යාලයට ගෙනැවිත් භාරදිය හැකි ය.

  වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න : නිෂා මිය 011-5748324

  ලේඛකාධිකාරි
  කොළඹ විශ්වවිද්‍යාලය